# ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.

## VII සභා වාරය පනස් අටවන මාසික සභා රැස්වීම් වාර්තාව.

**ස්ථානය : ඉඹුල්පේ ප්‍රාදේශිය සභාව.**

**දිනය : 2022.12.13.**

**වේලාව : පෙ.ව. 10.00.**

**ඉඹුල්පේ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ ගරු සභාපති එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදි.**

**මෙදින සහභාගීත්වය:**

**01.** ගරු සභාපති - එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
**02.** ගරු උප සභාපති - එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
**03.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
**04.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
**05.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
**06.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
**07.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා.
**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය.
**09.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
**10.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ගුරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
**11.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - දෙවටගේ ධර්මදාස මැතිතුමා.
**12.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා.
**13.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
**14.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
**15.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය.
**16.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා.
**17.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
**18.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
**19.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.
**20.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, - කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා.
**21.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, - මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.
**22.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
**23.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
**24.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා.

**මෙදින සහභාගී නොවූ මන්ත්‍රීවරුන්:**

**01.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.

**නිලධාරි සහභාගීත්වය:**

01. ලේකම් - ඩී.ඒ.සී.ආර්. දසනායක මිය.
02. සංවර්ධන නිලධාරි - ටී.ටී. රුවන්දිකා මිය.

ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ VII සභා වාරයේ පනස් අටවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරි මහත්ම මහත්මීන් සහ මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියලු දෙනා ආගම සිහිකිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා විසින් පිළිගන්නා ලදි. පෙ.ව. 10.00 ට සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## (01). පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් 2022.11.15. වන දින පැවැති මහ සභාවේ සභා වාර්තාව සභාගත කරමින් එම වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසට ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් 2022.11.15. වන දින පැවැති සභාවේ සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කල අතර ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

යථා පරිදි කල් දි ඇති යෝජනා තීරණ අංක (05) (vi) හි,
සේවා ගිවිසුම් මත සේවයට බඳවාගන්නා ලද සෞඛ්‍ය කම්කරුවන්ගේ හා වැඩ ක්ෂේත්‍ර කම්කරුවන්ගේ සේවා ගිවිසුම් කාලය ඉදිරි මාස 12 ක් සඳහා දීර්ඝ කිරිමේ යෝජනාව සඳහා ජේ.එච්. ප්‍රසන්න කුමාර සෞඛ්‍ය කම්කරුවාගේ නම ඇතුළත් වී නොමැති බැවින්, එම නම ද ඇතළත්ව එම යෝජනාව සංශෝධනය විය යුතු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව 2022. 11.15. වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ සභා වාර්තාව සංශෝධන සහිතව යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (02). ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

(i). හදිසියේ ඇති වූ අධික සුළි කුණාටුව හේතුවෙන් බල ප්‍රදේශයේ ජනතාවට දැඩි ආපදා තත්ත්වයකට මුහුණ දීමට සිදුවුණා. නිවාස, ජල සම්බන්ධතා, විදුලි සම්බන්ධතා වලට හානි සිදු වී තිබුණු බැවින්, නිවාඩු දින නොතකමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, විදුලි අධිකාරිතුමා, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය, කාර්මික නිලධාරි මහතා, රියදුරන් ඇතුළු කාර්ය මණ්ඩල නිලධාරින් මැදිහත් වී ජන ජීවිත යළි යථා තත්ත්වයට පත්කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ස්තූතිය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගන්නා අතර ප්‍රාදේශීය ලේකම්තුමියට, විදුලි අධිකාරිතුමාට ස්තූතිය පල කර යැවීමට කටයුතු කරනවා.

(ii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමේ කටයුතු මේ දිනවල සිදුවෙමින් පවතින බැවින් ඔබතුමන්ලාගේ සහ ඔබතුමියන්ලාගේ අවශ්‍ය ප්‍රමාණයට ඡයාරූප, දුරකතන අංක, ලිපිනය කඩිනමින් ලේකම්තුමිය වෙත ලබා දීමට කටයුතු කරන්න.

(iii). පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතවරුන්ගේ, නියෝජිතවරින්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස මීට පෙර අවස්ථා දෙකකදී දැනුවත් කළත් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත බොහොමයක් පළාත් පාලන ආයතන වලින් එම ප්‍රකාශ ලබා දිමට කටයුතු කර නොමැති බව නිරික්ෂණය වන බවත්, විගනනය විසින් ඒ සම්බන්ධයෙන් නිරන්තරයෙන් විමසුම් කරන බවත්, මෙය නෛතික අවශ්‍යතාවයක් බවත් සඳහන් කරමින් මුද්‍රා තබන ලද වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස් විසින් දන්වා එවා තිබෙනවා. එබැවින් වත්කම් බැරකම් ප්‍රකාශ කඩිනමින් ලේකම්තුමිය වෙත ලබාදෙන්න.

**(03). මාසික මහ සභාවට ලැබී ඇති ලිපි පෙත්සම් සංදේශ හා සන්නිවේදන ඉදිරිපත් කිරීම.**

**(i).** බෙලිහුල්ඔය ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති බෙලිහුල්ඔය ටෙරිකෝ රිසෝට් ආයතනය සඳහා විදුලිය ලබා ගැනීමට ස්ථාපිත කර ඇති කුඩා විදුලි බලාගාරය සඳහා බෙලිහුල්ඔයෙන් ජලය හරවා ගැනීමට අදාලව අවසර පත්‍රයක් ලබා දීම සලකා බැලීම සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ එකඟතාවය හා අනුමැතිය ලබා දෙන ලෙස සඳහන් කරමින් ඊට අදාලව ප්‍රාදේශීය ලේකම්තුමිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ඉහත යෝජනාව සඳහා එකඟතාවය හා අනුමැතිය ලබා දිම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව බෙලිහුල්ඔය ග්‍රාම නිලධාරි වසමේ පිහිටා ඇති බෙලිහුල්ඔය ටෙරිකෝ රිසෝට් ආයතනය සඳහා විදුලිය ලබා ගැනීමට ස්ථාපිත කර ඇති කුඩා විදුලි බලාගාරය සඳහා බෙලිහුල්ඔයෙන් ජලය හරවා ගැනීමට අදාලව අවසර පත්‍රයක් ලබා දීම සලකා බැලීම සඳහා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ එකඟතාවය හා අනුමැතිය ලබා දෙන බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දන්වා යැවීමට තීරණය විය.

**(ii).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට බල පෑ අධික සුළි සුළං තත්ත්වය හේතුවෙන් අටවක්වෙල, අලකොලඇල්ල, අමුවතුගොඩ, ප්‍රදේශවල ජනතාව හදිසි ආපදා තත්ත්වයකට මුහුණ පා ඇති අතර, පිළිකා ආතරයිටීස් වැනි නිදන්ගත රෝගාබාධවලින් පෙළෙන අහිංසක ජනතාව පවා මෙම ආපදා හානිදායක තත්ත්වයට මුහුණ පා ඇති බවත්, විදුලි සම්බන්ධතා විසන්ධි වී ඇති බවත්, වටිනා කොස් මී, කුඹුක්, පිහිඹියා ගස්වර්ග කඩා වැටීමෙන් ඒවා පරිසරයට අහිමි වී ඇති බවත්, ආර්ථික වටිනාකමක් ඇති එලදාව ලබන පොල්,තේ ගස් විනාශ වී යාම, නිසා ජන ජීවිත අඩාල වී ඇති බවත්, පොදු ස්ථාන වශයෙන් නෙල්ලිවල, අමුවතුගොඩ පාසල් හා සෞඛ්‍ය මධ්‍යස්ථානය ආපදාවට ලක්ව ඇති බවත් සඳහන් කරමින් ආපදා හානි සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
අධික සුළං තත්ත්වය හේතුවෙන් සිදුව ඇති ආපදා තත්ත්වයට රජයෙන් ආධාර ලබාදුන්නත්, එම ආධාර ප්‍රමාණවත් පරිදි ලබාදීම පිළිබඳව අවධානය යොමු කළ යුතු අතර, ප්‍රාදේශීය සභාවේ නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව මඟින් හෝ ආපදාවන්ට ලක් වූ ජනතාවට සහනාධාර ලබා දීමට කටයුතු කරමු. කොට්ඨාසභාර මන්ත්‍රීවරයා ලෙස ආපදාහානිවලට ලක් වූ ජනතාව වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරන අතර ආපදාවන්ට පත්ව ඇති ජන ජීවිත නැවත යළි යථා තත්ත්වයට පත් කිරීම සඳහා රජයේ විශේෂ අවධානය යොමු කරවීමට අදාල අංශ දැනුවත් කරමු.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
අධික සුළං තත්ත්වයෙන් ආපදාවන්ට ලක් වූ නිවාස වලට ආපදා හානිවීම් වෙනුවෙන් ආධාර ලබාදීමට අවශ්‍ය කටයුතු ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් **2021** වර්ෂයේ ලැබී ඇති කොරතුරු මත පදනම්ව ඇස්තමේන්තු සකසමින් සිටින බව දැනගැනීමට ලැබුණ බැවින් ඒ සම්බන්ධයෙන් මා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැළසුම් අධ්‍යක්ෂවරයා සමඟ සාකච්ඡා කළා. ඒ අනුව අඩි දහයක සෙවිළි ෂීට් එකක් සඳහා රු. **2250/-** ක මුදලක් ගෙවීමට තීරණය වි ඇත. එම නිලධාරීන් රාජකාරී කටයුතු කරන්නේ නිත්‍යානුකූල ආකාරයට වුවත් වර්තමාන වෙළඳපලේ පවතින මිල ගණන් සැලකිල්ලට ගෙන සාධාරණ මුදලක් ආපදා හානි වෙනුවෙන් ලබා දෙන ලෙසට කඩිනමින් සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාට, දිස්ත්‍රික් ලේකම්තුමියට දන්වා යැවීමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී,එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
අධික සුළං තත්ත්වය නිසා අටවක්වෙල කොට්ඨාසයේ නිවාස කිහිපයක් සම්පූර්ණයෙන් විනාශ වී ඇති අතර, අමුවතුගොඩ වසමේ අර්ධ ලෙස ඉදිකරමින් පැවැති එහෙත් ස්ථිර පදිංචි නොමැති නිවාස කිහිපයක් ද ආපදාවට ලක් ව ඇත. අර්ධ ලෙස ඉදිකරන ලද නිවාස පිළිබඳව වසමේ ග්‍රාම නිලධාරින් දැනුවත් කළත් ආධාර ලබා දීම පිළිබඳව නිර්ණායක නොදන්නා බව ප්‍රකාශ කළා. එබැවින් ආපදා හානි වූ නිවාස සඳහා සහනාධාර ලබා දීමේ දී පදිංචි නිවාස සඳහාත් පදිංචි වී නොමැති අර්ධ ලෙස ඉදිකරන ලද නිවාස සඳහාත් අපදා සහන ලබා දීමට පියවර ගන්නා ලෙසට අදාල අංශ දැනුවත් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
ගරු ජයානන්ද මැතිතුමාත් වගා හානි හා වටිනා ගස් වර්ග විනාශ වීම පිළිබඳව අදහස් ඉදිරිපත් කළා. ඒ් අනුව කෙසෙල්, පොල්, තේ වැනි ගස් වර්ග මෙන්ම කඩා වැටී ඇති අනෙකුත් ගස් වර්ග කඩිනමින් ඉවත් කළ යුතු වුවත් ග්‍රාමනිලධාරි නිර්දේශය නොමැතිව එම කටයුතු සිදුකල නොහැකි බැවින්, නැවත සුළං තත්ත්වයක් ඇතිවීමෙන් එම අනතුරුදායක ලෙස කඩා වැටී ඇති ගස් වර්ගවලින් නැවත අනතුරුදායක තත්ත්වයක් ඇති විය හැකි බැවින් ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරි මහතාගේ පරීක්ෂා කිරීමේ නිර්දේශය මත කඩිනමින් කඩාවැටී ඇති ගස් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
වලේබොඩ වසමේ බොහෝ නිවෙස්වල වලහයට, සෙවිලි ෂීට් වලට සුළඟින් අලාභහානි වී ඇති අතරම, ගොවිබිම් ආශ්‍රිතව වගා හානි සිදුවී ඇති බැවින් මේ පිළිබඳව ප්‍රාදේශීය ගොවිජන සේවා සංවර්ධන නිලධාරිවරයා දැනුවත් කර ආපදාවට ලක් වූවන් සඳහා සහන මිළට පොහොර ලබා දෙන ලෙසට ඉල්ලීමක් කරමු.
ආපදා හානි තත්ත්වය පිළිබඳව වසම භාරව කටයුතු කරන ග්‍රාම නිලධාරිනිය දැනුවත් කිරීමට ගම්වාසීන් විසින් පියවර ගත්තත් එම නිලධාරිනිය ආපදාහානි පරීක්ෂා නොකළ බව ප්‍රකාශ කළා. එබැවින් කොට්ඨාසභාර මන්ත්‍රීවරයා ලෙස ග්‍රාම නිලධාරිනිය දැනුවත් කිරීමට මා උත්සහ කල අවස්ථාවේ දී එම නිලධාරිනියට කාර්යාල රාජකාරී සඳහා යා යුතු බවත්, මන්ත්‍රීතුමාගේ හිතවතුන් පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙසත් ප්‍රකාශ කළා. ආපදා තත්ත්වය ඇති වූ දිනයේ දී පවුල් 129 ක් පමණ පාසල තුල රැඳී සිටියා. වසම භාරව කටයුතු කරන සංවර්ධන නිලධාරිනිය දැනුවත් කිරීමත් සමගම එම නිලධාරිනිය පැමිණ ආපදාහානිවීම් පරීක්ෂා කළා.
උතුරු වලේබොඩ වතුයායට අයත් වතු නිවාස සියල්ලම අධික සුළං තත්ත්වය නිසා ආපදාවට ලක් ව ඇතත්, වතු අධිකාරිවරුන් යටතේ මෙම වතු නිවාස පාලනය වන බැවින්, රජයෙන් වතු ජනතාවට ආධාර නොලැබේ. එහෙත් එම ජනතාව ඉතා අසරණ තත්ත්වයෙන් සිටින බැවින්, විශේෂ අවධානය යොමු කර සහන සලසා දෙන ලෙසට අදාල අංශ දැනුවත් කිරීමට පියවර ගනිමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
අධික සුළං තත්ත්වය හේතුවෙන් අනතුරුදායක අන්දමින් කඩා වැටී තිබුණු ගස් කඩිනමින් ඉවත් කිරීමට මිනිස් ශ්‍රමය ලබාදුන්නත්, චේන්ෂෝ මැෂින් යන්ත්‍රයක් නොමැතිවීම ගැටළුවක් වුණා. පින්නවල පොලීස් ස්ථානයට පවා දැනුම් දී සහයෝගය ලබා ගැනීමට පියවර ගත්තා. එබැවින් මෙවැනි හදිසි අවස්ථාවල භාවිතයට ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවට සභා අරමුදලින් චේන්ෂෝ මැෂින් යන්ත්‍රයක් මිළදී ගතයුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදුව ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
අධික සුළං තත්ත්වය හේතුවෙන් කඩා වැටුණු ගස් ඉවත් කිරීමේ කටයුතු සඳහා චේන්ෂෝ මැෂිමක් අත්‍යාවශ්‍ය වුණා. මෙය ඉතා වටිනා යෝජනාවක් බව ප්‍රකාශ කරමින් කඩිනමින් මිළදී ගැනීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී,මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය අදහස් දක්වමින්,
වලේබොඩවත්ත වතුයායේ වතු නිවාසවල වහල සෙවිලි කර තිබූ සෙවිලි තහඩු අධික සුළං තත්ත්වය හේතුවෙන් ගැලවීයාම නිසා වර්ෂාවෙන් එම නිවාස වල පදිංචිව සිටි දරුවන්ගේ පොත්පත් විනාශ වෙලා. එක නිවාසයක් පමණක් කඩාවැටී තිබුණු අතර එම නිවාසය ඔවුන් විසින් පිළිසකර ගැනීමට කටයුතු කළා. වසම භාරව කටයුතු කරන ග්‍රාම නිලධාරිනිය ආපදාහානි පිළිබඳව සොයා බැලීමක් සිදුකර නැහැ. සභාව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරියක් ලෙස ඔවුන් පිළිබඳව මෙලෙස හඬ නොනගන්නේනම් ඔවුන්ගේ තොරතුරු ඉදිරිපත් කිරීමට වෙනත් ක්‍රමයක් නැහැ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වමින්,
වතු කම්කරු ජනතාව වතුසමාගම් සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබාදුන්නත්, වතුකම්කරුවන් සහ වතුසමාගම් වතු අධිකාරිවරුන් යටතේ පාලනය වන බැවින් එම වතුකම්කරු ජනතාවගේ දුක්බර ජීවන ක්‍රමය පිළිබඳව දැනුවත් කිරීමට වතු අධිකාරුවරුන් හැර වෙනත් කිසිවෙක් නැහැ. වතු අධිකාරිවරුන් වතු නිවාස සඳහා ලබා දීමට නියමිත සෙවිලි තහඩු නිසි පරිදි ලබා නොදීම ගැටළුවක්. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුවත් කළත් වතු ජනතාව පිළිබඳව සොයා බැලීමට රජයෙන් කිසිදු වැඩ පිළිවෙලක් හෝ ඔවුන්ගේ ප්‍රශ්න වලට විසඳුමක් නැහැ. මේ නිසා ප්‍රාදේශීය සභාව මැදිහත් වී මුදල් ආධාර හා පාසල් දරුවන් වෙනුවෙන් පාසල් ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරමු.

අනතුරුව, ගරු සභාපතිතුමා නැවතත් ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
අධික සුළං තත්ත්වය නිසා රත්නපුර දිස්ත්‍රික්කයෙන් වැඩිම හානිය සිදුව ඇත්තේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටයි. බල ප්‍රදේශයේ වසම් කිහිපයකටම මෙම අයහපත් ආපදා තත්ත්වයට මුහුණ පෑමට සිදු වුණා. ප්‍රාදේශීය සභාවේ සභා අරමුදල් ප්‍රමාණය සලකා බලා නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු නිර්දේශය සහිතව සහන සලසා දීම පිළිබඳව සලකා බැලීමට පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ අදහස් දක්වීම අනුව,
අධික සුළං තත්ත්වය හේතුවෙන් උතුරු වලේබොඩ වසමේ පූර්ණ ලෙස හානි වූ නිවාස හෝ අර්ධ ලෙස හානි වූ නිවාස කිසිවක් නොමැති බවත්, එක් දේපල හානියක් පමණක් සිදු වී ඇති බවත් ප්‍රාදේශීය ලේකම්තුමිය මා වෙත දැනුම් දුන්නා. අවශ්‍ය අවස්ථාවන්වලදී මහජනයාට සේවය සලසාදීම හා ඔවුන් ආරක්ෂා කිරීම මහජන නියෝජිතවරුන්ගේ වගකීම බැවින් අපදා අවස්ථාවේ දී වලේබොඩ වසම භාර ග්‍රාම නිලධාරිනියගේ නිරීක්ෂණ කටයුතු වල සිදු වූ අක්‍රමිකතා පිළිබඳව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා වෙතින් විමසා බලා පරීක්ෂණයක් පවත්වන ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කිරීමට පියවර ගන්නවා.
වතුආශ්‍රිත සහෝදර කම්කරු ජනතාව වතු අධිකාරිවරුන් යටතේ පාලනය වන බැවින් ඔවුන් පිළිබඳව විමසා බැලීමට හැකියාවක් නොමැති අතර ඔවුන්ට සිදුව ඇති ආපදා තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරන ලෙස වතු අධිකාරිවරුන් වෙත දන්වා යැවීමටත්, වතුකම්කරු ජනතාවට සහනාධාර ලබාදීම සම්බන්ධයෙන් රජයට මැදිහත් වී කටයුතු කළ නොහැකි වුවත් ඉදිරියේ දී සිදුවන මෙවැනි අවස්ථාවන් වලදී ඔවුන් පිළිබඳව විමසා බැලීමට හැකි ආකාරයට වැඩ පිළිවෙලක් සකසන ලෙසත් දන්වා යැවීමට කටයුතු කරනවා.
ආර්ථික වශයෙන් දුර්වල තත්ත්වයක මෙන්ම, විධිමත් ආකාරයට නිවාස ඉදිකර නොතිබුණු නිවාස හා ස්ථිර පදිංචි නොමැති අර්ධ ලෙස ඉදිකර තිබුණු නිවාසවලට වැඩි වශයෙන් ආපදාහානි සිදුවී ඇති බැවින් මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලෙසත්, ආපදා සහන ලබාදීමේ දී වර්තමාන වෙළඳපලේ පවතින මිළ ගණන් සැලකිල්ලට ගෙන ඇස්තමේන්තු සකසන ලෙසත් දිස්ත්‍රික් ලේකම්තුමිය වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

පින්නවල ජල යෝජනා ක්‍රමයේ ජල මූලාශ්‍රය ආරම්භ වන්නේ වලේබොඩ ප්‍රදේශයෙන් බැවින් එම ප්‍රදේශයට බලපා තිබූ ආපදා හානිදායක තත්ත්වය ඉවත් කර කඩිනමින් ජල සැපයුම ලබාදීමට දින තුනක් ගත වුණා. ඊට

හේතුව අනතුරුදායක වූ ගස් කඩිනමින් ඉවත් කිරීමට චේන්ෂෝ මැෂින් යන්ත්‍රයක් නොතිබීම හේතුවයි. එම නිසා සභාවට සහඅරමුදලින් චේන්ෂෝ මැෂින් යන්ත්‍රයක් මිලදී ගැනීමට කටයුතු කරනවා.

**(ii).** අධික සුළං තත්ත්වය නිසා ගුරුබැවිල වසමේ, පින්නකන්ද ගමේ ප්‍රජා ශාලාවේ පවත්වාගෙන යනු ලබන සමනල පෙර පාසලේ වහලයට අලාභහානි සිදු වී ඇති බවටත්, මේ නිසා පෙර පාසල පවත්වාගෙන යා නොහැකි තත්ත්වයේ පවතින බවත්, පෙර පාසල යථා තත්ත්වයට පත් කරගැනීමට සහන සලසා දෙන ලෙසත් දන්වමින් ප්‍රධාන පෙර පාසල් පාලිකා එන්.ඩබ්. පද්මා නන්දනී මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
මෙම පෙර පාසලට දැඩි ලෙස හානි සිදු වී ඇති බැවින් සහන සලසා දීමට පියවර ගනිමු.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
ඉහත නම සඳහන් පෙර පාසල අධික සුළං තත්ත්වය නිසා ආපදා තත්ත්වයට පත්ව ඇති බැවින්, විශේෂ අවධානය යොමු කර ආපදා සහනාධාර ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට දන්වා යැවීමට කටයුතු කරනවා.

**(iii).** ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඹුල්පේ, පස්සරමුල්ල, අමුවතුගොඩ, මැදගෙදරගොඩ, වසම්වලට බලපෑ අධික සුළං තත්ත්වය නිසා ගස් කඩා වැටීමෙන් නිවාස හානියට පත්ව ඇති බැවින් එම නිවාස අලුත්වැඩියා කිරිම සඳහා එම කඩා වැටුණු ගස් ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාව පිළිබඳව විමසා බලා ඒ සඳහා අඩු ආදායම්ලාබීන්ට අවස්ථාව සලසා දීම, කඩා වැටී ඇති ගස්වර්ග කඩිනමින් ඉවත් කල යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය නීත්‍යානුකූල පසුබිම සලසා දීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින්,
ආපදාහානි වූ නිවාස අලුත්වැඩියා කරවා ගැනීමට දැව ප්‍රයෝජනයට ගැනීමටත්, කඩා වැටී ඇති ගස් එම ස්ථාන වලින් ඉවත් කිරිම සඳහාත් නිත්‍යානුකූල අවසරය ලබා දීමට අවශ්‍ය කටයුතු සලසමු.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
ප්‍රාදේශීය සභාවට අයත් ගලගම බහුකාර්ය ගොඩනැගිල්ල අසල ද සුළඟට ගසක් කඩා වැටී ඇති අතර එමඟින් ද දැව සපයා ගැනීමට හැකියාව පවතින අතර, නිසි ප්‍රයෝජනයට නොගැනීමෙන් එම ගසා දිරාපත් වේ. එම නිසා ආපදාහානිය සඳහා දැවමය අවශ්‍යතා ඇති අඩු ආදායම්ලාබීන්ට ග්‍රාම නිලධාරි නිර්දේශය සහිතව අවශ්‍ය දැව ප්‍රමාණය තීරණය කරන ලෙසත්, දැව කපා ගැනීමට අවශ්‍ය වියදම් ඉල්ලුම්කරුවන් විසින් දරන ලෙසත්, සභාවේ එකඟතාවය පල කර නිත්‍යානුකූල අවසරය සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමාගේ අදහස් දැක්වීම අනුව,
කඩා වැටුණු ගස් ඉවත් කිරිම සඳහා ඉඩම් වල නිත්‍යානුකූලභාවය පරීක්ෂා කර බලා අලාභහානි වූ නිවාස අලුත්වැඩියා කරගැනීමටත්, දැව අවශ්‍ය නොවන එහෙත් අලාභහානි වූ නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ගස් අලෙවිකර මුදල් ලබාගැනීම සඳහා විශේෂ අවස්ථාවක් ලෙස සලකා බලපත්‍ර සකසා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමිය දැනුවත් කිරීමටත් රජයේ ඉඩම් සම්බන්ධයෙන් කඩිනමින් බලපත්‍ර සකසා දෙන ලෙසට දැනුවත් කිරීමටත් පියවර ගන්නවා.

## (04). යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නැත.

**(05). යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**(i). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට 2023 වර්ෂය සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන සැළැස්මට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

2023 වර්ෂය සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීමට අදාල ප්‍රසම්පාදන සැළැස්ම අනුමත කිරීම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, 2023 වර්ෂය සඳහා සැපයුම් හා සේවාවන් ලබා ගැනීමට අදාල ප්‍රසම්පාදන සැළැස්ම අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

**(ii). විගණන හා කළමකරණ කමිටුව 2023 වර්ෂයේ පැවැත්වීම සඳහා කමිටු සාමාජිකයන් වශයෙන් ප්‍රාදේශීය සභා ගරු සභාපති, ප්‍රාදේශීය සභා ලේකම්, විගණන අධිකාරි, අභ්‍යන්තර විගණන නිලධාරි, විමර්ශන නිලධාරි, ප්‍රජා සංවර්ධන නිලධාරි, ආයතනයේ අංශභාර නිලධාරි යන අය පත් කිරීමත්, කමිටුව පැවැත්වීමට පළමු කාර්තුව මාර්තු මස 21 වන සඳුදා, දෙවන කාර්තුව ජූලි මස 20 වන බ්‍රහස්පතින්දා, තුන්වන කාර්තුව ඔක්තෝම්බර් මස 24 වන බ්‍රහස්පතින්දා, හතරවන කාර්තුව දෙසැම්බර් මස 21 වන බ්‍රහස්පතින්දා යන දිනයන්හි පැවැත්වීම සඳහා ඊට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.**

2023 වර්ෂය සඳහා නම් කරන ලද කමිටු සාමාජිකයන් පත් කිරීමත්, කමිටුව පැවැත්වීම සඳහා ඉදිරිපත් කරන ලද දින තීරණය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි

ඒ අනුව, 2023 වර්ෂය සඳහා නම් කරන ලද කමිටු සාමාජිකයන් පත් කිරීමත්, කමිටුව පැවැත්වීම සඳහා ඉදිරිපත් කරන ලද දින තීරණය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(iii). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසලට 2023 වර්ෂය සඳහා ළමුන් ඇතුළත් කරවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතින බවත්, ඒ සඳහා පෙර පාසල අලුත්වැඩියා කළ යුතු බවත්, ඩෙස්පුටු හා අත්‍යාවශ්‍ය උපකරණ කිහිපයක් අබලන් වී ඇති බැවින් ඒවා අලුතුවැඩියා කළ යුතු බවත්, ප්‍රමාණවත් ඩෙස් පුටු නොමැති බැවින්, එම උපකරණ ප්‍රමාණවත් පරිදි සපයා දෙන ලෙසත්, පෙර පාසල වටා ආරක්ෂිත වැටක් සකස් කර දෙන ලෙසත් ඉල්ලීම් කරමින් ඊට අදාලව ආර්.ඒ.ඩී.එන්. රණසිංහ පෙර පාසල් පාලිකාව විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.**

අමුද්‍රව්‍ය මිළදීගෙන පෙර පාසල අලුත්වැඩියා කිරීමටත්, පෙර පාසලට අත්‍යවශ්‍ය උපකරණ මිළදී ගැනීමත්, පෙර පාසල වටා ආරක්ෂිත වැට ඉදි කරවා ගැනීමත් සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, අමුද්‍රව්‍ය මිළදීගෙන පෙර පාසල අලුත්වැඩියා කිරීම, පෙර පාසලට අත්‍යවශ්‍ය උපකරණ මිළදී ගැනීම හා පෙර පාසල වටා ආරක්ෂිත වැට ඉදි කරවා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

**(iv). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් කුමරතුඟු මහජන පුස්තකාලය සඳහා ළමා අංශයේ පොත් ඇසිරීම සඳහා ප්‍රමාණවත් පරිදි පොත් රාක්ක නොමැති බැවින්, උස අඩි 4 x පළල අඩි 4 x ගැඹුර අඩි 1 ප්‍රමාණයේ**

වානේ පොත් රාක්ක දෙකක් සාදවා ගැනීමට අදාලව ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

උස අඩි 4 xපළල අඩි 4 x ගැඹුර අඩි 1 ප්‍රමාණයේ වානේ පොත් රාක්ක දෙකක් සාදවා ගැනීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව උස අඩි 4 xපළල අඩි 4 x ගැඹුර අඩි 1 ප්‍රමාණයේ වානේ පොත් රාක්ක දෙකක් සාදවා ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(v). 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත 12 (1) වගන්තිය ප්‍රකාරව ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා කාරක සභා පත් කිරිම සහ විෂය පථය පැවරීම සම්බන්ධ ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.
ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,
2022 වර්ෂයට පත් කරන ලද කමිටු සාමාජිකයන් ම 2023 වර්ෂය සඳහා පත් කිරීම සුදුසු බවත්, කමිටු කටයුතු සාර්ථක අන්දමින් පවත්වාගැනීමට, මහජනතාවට සේවය කිරීමට සාමාජිකයන්ගේ පැමිණීම අත්‍යාවශ්‍ය බවත්, ඒ සඳහා මහජන නියෝජිතවරුන් බැඳී සිටින බවත්, සභාපතිවරයාගේ බලතල සීමා කිරීමේ අරමුණින් සහ නිලධාරීන්ගේ වගකීම් විධිමත් කිරීමේ අරමුණින් බලය බෙදාහැරීම සඳහා කමිටු පවත්වන බවත් ප්‍රකාශ කරමින් හිටපු විපක්ෂ නායක වශයෙන් කටයුතු කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේ මැතිතුමා නියෝජනය කළ කමිටු සාමාජිකත්වය වෙනුවට, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා පත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදි.

01). 2023 වසරට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව පත් කර ගැනීම හා කමිටුවේ විෂය පථය.
2023 වර්ෂය සඳහා සභාවේ මූල්‍ය කටයුතු වලට උපදෙස් ලබා දීම, වියදම් අනුමත කිරීම සඳහා සභාවට නිර්දේශ ලබාදීම, ආදායම් උත්පාදන මාර්ග හා ආදායම් ඒකරාශීකරණය සඳහා මඟ පෙන්වීම හා උපදෙස් ලබාදීම ඇතුළු සභාවේ මූල්‍ය කටයුතු පවත්වා ගැනීම සඳහා සභාවට නිර්දේශ හා මඟපෙන්වීම සඳහා පහත නම් සඳහන් සාමාජිකාවන්ගෙන් යුත් කාරක සභාවක් පත් කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

01.ගරුසභාපති,එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
02.ගරුඋපසභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
03.ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
04.ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා
05.ගරුප්‍රාදේශීයසභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා.
06.ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමා.
07.ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
08.ගරුප්‍රාදේශීයසභාමන්ත්‍රී, අයි. ඇන්ටනී ප්‍රගාස් මැතිතුමා.
09.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය.

02). 2023 වසරට නිවාස හා ප්‍රජාසංවර්ධන කමිටුව පත් කිරීම හා විෂය පථය
2023 වර්ෂය සඳහා බල ප්‍රදේශයේ අඩු ආදායම් ලාභීන්ගේ නිවාස ගැටලු විසඳීම සඳහා යෝජනා, පදිංචි නිවාසවල මහජන සෞඛ්‍ය ආරක්ෂා කිරීම පිළිබඳ යෝජනා, හා බල ප්‍රදේශයේ ප්‍රජා සංවර්ධන කටයුතු, ගැමි කාන්තා සංවර්ධන කටයුතු , රැකියා වැඩ පිළිවෙලවල් ඇති කිරීම හා සුභ සාධන කටයුතු පිළිබඳව සභාවට උපදෙස් හා නිර්දේශ ලබාදීම සඳහා පහත නම් සඳහන් සාමාජිකාවන්ගෙන් යුත් කාරක සභාවක් පත් කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා.
03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා.
04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා

**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා.
**09.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය.

**03). 2023** වසරට කාර්මික සේවා කමිටුව පත් කිරීම හා විෂය පථය.
**2023** වර්ෂය සඳහා බල ප්‍රදේශයේ කාර්මික හා සංවර්ධන කටයුතු පිළිබඳව සභාවට උපදෙස් දීම හා ඒ පිළිබඳ වැඩි දුර කරුණු සාකච්ඡා කර ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා පහත නම් සඳහන් සාමාජිකාවන්ගෙන් යුත් කාරක සභාවක් පත්කිරීම සුදුසු බවට යෝජනා කරන්නීය.

**01.**ගරුඋපසභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
**02.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
**03.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ජී.ඩී.එන්. අබේවික්‍රම මැතිතුමා.
**04.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමා.
**05.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා.
**06.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්. අමිල සමන් ගුණසේකර මැතිතුමා
**07.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ඩබ්.ජී. සුමිත් ගුනරත්න මැතිතුමා
**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය

**04). 2023** වසරට පරිසර හා පහසුකම් කමිටුවට සාමාජිකයන් පත් කිරිම හා විෂය පථය
**2023** වර්ෂය සඳහා බල ප්‍රදේශයේ පරිසර සංරක්ෂණ කටයුතු පවත්වාගෙනයාම, වැඩිදියුණුකිරීම ,හා ස්වභාවික පරිසරය ආරක්ෂා කිරීමට අදාල ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සහ බල ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් වැඩිදියුණුකිරීම හා ආරක්ෂා කිරීමට අදාලව නිර්දේශ හා මඟ පෙන්වීම් සභාවට ලබාදීම, සහ ව්‍යාපෘති වාර්තා ඉදිරිපත් කිරීම සඳහා පහත සාමාජිකයන්ගෙන් යුත් කාරක සභාවක් පත් කිරීමට යෝජනා කරන්නීය.

**01.** ගරුසභාපති,එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල්සෙනරත්මැතිතුමා.
**02.** ගරුඋපසභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
**03.** ගරුප්‍රාදේශීයසභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා.
**04.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
**05.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා.
**06.** ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා.
**07.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමා.
**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
**09.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා

II. ටෙන්ඩර් මණ්ඩලය පත් කිරීම.
**2023** වර්ෂය සඳහා සභාවේ ප්‍රසම්පාදන මණ්ඩලය ලෙස පහත නම් සඳහන් සාමාජිකයන් පත්කිරිම සුදුසු බවට යෝජනා කරන්නීය.

**01.** ගරුසභාපති,එස්.ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත් මැතිතුමා.
**02.** ගරුඋපසභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා.
**03.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා.
**04.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.කේ. නයනප්‍රිය චමින්ද කුමාර මැතිතුමා
**05.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ගරුගේ චන්ද්‍රපාල මැතිතුමා.
**06.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා.
**07.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, දෙවටගේ ධර්මදාස මැතිතුමා.
**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය
**09.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ර්.එච්.එම්. ගුනසේන මැතිතුමා.

පෙර වර්ෂයේ කමිටු සඳහා පත් කරන ලද සාමාජිකයන්ම ඉදිරි වර්ෂය සඳහා පත් කිරීමත්, **2023** වසරට පරිසර හා පහසුකම් කමිටුවට සාමාජිකයන් පත් කිරිම හා විෂය පථය පැවරීමේ දී හිටපු විපක්ෂනායකවශයෙන් කටයුතු කළ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.එල්.ඒ. ලසන්ත උදය රුවන් කුරේමැතිතුමා නියෝජනය කළ කමිටු සාමාජිකත්වය වෙනුවට, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න

මැතිතුමා පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
ඉතා වැදගත් කමිටුවක් වන ටෙන්ඩර් මණ්ඩල කමිටු රැස්වීම නියමිත වේලාවට රැස්වී කමිටු කටයුතු ක්‍රියාත්මක කල යුතුයි. වගකීමෙන් යුතුව කමිටුවට සහභාගී විය යුතුයි. එසේ නොමැති නම් ස්ව කැමැත්තෙන් ඉවත්ව වෙනත් අයෙකුට අවස්ථාව ලබා දිය යුතුයි.

මෙම අවස්ථාවේදී ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා නැගී සිටිමින් පෙර වර්ෂයේ දී සියළුම කමිටු සඳහා පත් කරන ලද කමිටු සාමාජිකයන්ගේ නම් සභාවට ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීමක් කල බැවින්, ගරු සභාපතිතුමා විසින් එම සියළු කමිටු සඳහා පත් කරන ලද කමිටු සාමාජිකයන්ගේ නම් එකින් එක සභාවට ඉදිරිපත් කරන ලදි.

ඒ අනුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂය සඳහා කාරක සභා පත් කිරීම සහ විෂය පථය පැවරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vi). ඉදිරි වර්ෂය තුල පළාත් පාලන ආයතනයේ සාමාන්‍ය මාසික මහා සභා රැස්වීම් පැවැත්වෙන දිනයන් ව්‍යවස්ථාපිත ප්‍රතිපාදනවලට අනුව පෙර වර්ෂයේ දී නිශ්චය කර තිබිය යුතු බැවින් 2023 වර්ෂයට අදාලව මාසික මහ සභා රැස්වීම පැවැත්වෙන දින තීරණය කරවා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,

මාසික මහ සභාව පැවැත්වෙන දිනයට සතියේ වැඩ කරන දින හතරකට පෙර මාසික මහ සභා වාර්තාව සමඟ ලබා දිය යුතු සියළු ලිපි ලේඛන හා වාර්තාවන් යොමු කල යුතුය. එබැවින්, ඊට අදාල වන මුදල් හා ප්‍රතිපත්ති සැළසුම් කමිටුව වැනි කමිටු රැස්වීම් ඊට සමගාමීව පවත්වා තිබිය යුතුය.

සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින මාසික මහ සභාව පැවැත්වීමත්, මුදල් හා ප්‍රතිපත්ති සැළසුම් කමිටුව සඳහා වවුචර් වාර්තා ඉදිරිපත් කිරීමේ දී සෑම මාසයක 20 වෙනි දින සිට ඊ ළඟ මාසයේ 20 වෙනි දින දක්වා ඉදිරිපත් කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුණරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින මාසික මහ සභාව පැවැත්වීමත්, මුදල් කමිටුව සඳහා වවුචර් වාර්තා ඉදිරිපත් කිරීමේ දී එක් මාසයක 20 වෙනි දින සිට ඊ ළඟ මස 20 වෙනි දින දක්වා ඉදිරිපත් කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vii).ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ දී කාර්ය මණ්ඩල නිලධාරින් පුහුණු කිරීම සඳහා අපේක්ෂිත වන පුහුණු වැඩසටහන් ඇතුළත් වාර්ෂික පුහුණු සැළැස්ම පිළබඳ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදි.

2023 වර්ෂයට අදාල කාර්ය මණ්ඩල නිලධාරින් පුහුණු කිරීමට අපේක්ෂිත පුහුණු සැළැස්ම අනුමත කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ.ආර්. ජයානන්ද මැතිතුමා විසින් යෝජනා කරන ලදි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඒ අනුව 2023 වර්ෂයට අදාල කාර්ය මණ්ඩල නිලධාරින් පුහුණු කිරීමට අපේක්ෂිත පුහුණු සැළැස්ම අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(vii). 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 උප වගන්තිය යටතේ පිරිනැමී ඇති බලතල ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ බලතල පාවිච්චි කිරීමේ සහ යුතුකම් ඉටු කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි ප්‍රාදේශීය සභාවට පෙනී යා හැකි අන්දමේ වූ ද, මේ පනතේ විධි විධානවලට අනුකූල නොවන්නා වූ ද අතුරු ව්‍යවස්ථා කාලයෙන් කාලයට සෑදීමටත්, එසේ සාදනු ලබන යම් අතුරු ව්‍යවස්ථාවක් සංශෝධනය කිරීමට, වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමටත් සෑම ප්‍රාදේශීය සභාවකටම බලතල තිබිය යුතු බවත්, 126 වන උප වගන්තිය යටතේ ප්‍රාදේශීය සභාවකට පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට ප්‍රාදේශීය සභාවකට බලතල පැවරී ඇති බවත් ප්‍රකාශ කරමින් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කිරීම සඳහා උපදෙස්, අදහස් හා යෝජනා ලබාගැනීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළුව ඒ සම්බන්ධයෙන් දැනුමක් ඇති මහජන නියෝජිතවරුන් දෙදෙනෙක් හා ප්‍රාදේශීය සභා ලේකම් ඩී.ඒ.සී.ආර්. දසනායක ඇතුළු විෂය නිලධාරි වමෝදි ප්‍රසන්තිකා මිය , සභා කටයුතු නිලධාරි ටී.ටී රුවන්දිකා මිය, ජල අංශය දේවිකා මිය, වරිපනම් තක්ෂිලා ජයබාහු මෙනවිය, පරිසර විෂය ශානිකා, ගිණුම් අංශය කේෂලා මිය, සෞඛ්‍ය අංශය මංජුල මයා, දැන්වීම් පුවරු සුපුන් අමුවල මයා, ගිණුම් අංශය දීපිකා සංජීවනී මිය, ආදායම් බදු රැස්කිරීම රුවින්ද මයා කාර්යාල නිලධාරි මණ්ඩලය පත් කිරීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
පුහුණු පාඨමාලාවන් සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා සහභාගී වූ බැවින් එතුමා මේ සඳහා පත් කිරීම සුදුසු බවට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.
මේ සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ.ආර්. ජයානන්ද මැතිතුමා පත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී,කේ.ඩී.ඒ. උපුල් ආසිරි ජයරත්න මැතිතුමා විසින් ඉහත යෝජනා දෙකම ස්ථිර කරන ලදී.
ඒ අනුව අතුරු ව්‍යවස්ථා සකස් කිරීම සඳහා ගරු සභාපතිතුමා ඇතුළුව ඉහතින් නම් කරන ලද මහජන නියෝජිතවරුන් දෙදෙනාත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත් පත්කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(ix). වර්ෂ අවසානයේ බිල්පත් ගෙවීමේ වැය දැරීම සඳහා සභා අරමුදල් ප්‍රමාණවත් තත්ත්වයක නොමැති බැවින් සභා අරමුදලින් පවත්වාගෙන ගිය 86027927 අංක දරණ ස්ථාවර තැන්පත් ගිණුමේ මුදල් ආපසු ලබා ගැනීමට අදාල යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.
සභා අරමුදලින් පවත්වාගෙන ගිය රු. 2, 000,000.00 වටිනා 86027927 අංක දරණ ස්ථාවර තැන්පත් ගිණුමේ මුදල් ආපසු ලබාගැනීම සුදුසු බව ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව සභා අරමුදලින් පවත්වාගෙන ගිය රු. 2, 000,000.00 වටිනා 86027927 අංක දරණ ස්ථාවර තැන්පත් ගිණුමේ මුදල් ආපසු ලබාගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(x). ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවට අයත් ජල ව්‍යාපෘති මඟින් ජල සම්බන්ධතා ලබා දීමේ දී දැනට අය කරනු ලබන නව ජල සබඳතා ගාස්තුව රු. 7500/- වන අතර, නව ජල සබඳතා ලබා දිමට අවශ්‍ය වන ජල මීටරය ඇතුළු උපාංග වල මිළ ඉහළයාම නිසා එම පිරිවැය අයකර ගැනීමට දැනට අයකරනු ලබන ගාස්තුව ප්‍රමාණවත් නොවන බැවින්, එම ගාස්තුව රු. 13000/- ලෙස සංශෝධනය කිරීමටත්, බෙදා හැරීමේ නල පද්ධතියේ සිට ජල මීටරය දක්වා අවශ්‍ය නල ප්‍රමාණය සහ නැවතුම් කපාට (stop volve) ජල ඉල්ලුම්කරුවන් විසින් සැපයිය යුතු බවත් ප්‍රකාශ කරමින් ඊට අදාල වූ යෝජනාව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

නව ජල සබඳතා ලබා දීම සඳහා දැනට අය කරනු ලබන රු 7500/- ක ගාස්තුව ප්‍රමාණවත් නොවන බැවින්, එම ගාස්තුව රු. 13000/- ක් ලෙස සංශෝධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්මින්,
නවජල සම්බන්ධතා ලබා ගැනීම සඳහා සංශෝධනය කරන ලද ජල ගාස්තු අය කිරීමේ දී අඩු ආදායම්ලාභීන්ට සහනයක් ලෙස මෙම මුදල වාර දෙකකින් ගෙවීමට හැකිවන පරිදි, ඒ සඳහා අවස්ථාව සකසා සහන සලසා දිය හැකිද?

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් අදහස් දක්වමින්,
නිදන්ගත රෝගාබාධවලින් පෙළෙන අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරි නිර්දේශ කරනු ලබන විශේෂ ඉල්ලුම්කරුවන් සඳහා මේ සඳහා අවස්ථාව ලබා දීමට හැකියි.

ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා අදහස් දක්වමින්,
සමෘද්ධිලාභීන් වැනි අඩු ආදායම්ලාභීන් ලෙස ග්‍රාම නිලධාරි විසින් නිර්දේශ කරන ඉල්ලුම්කරුවන් සඳහා නව ජල සබඳතා ගාස්තු වශයෙන් රු. 10000/- ක මුදලක් අය කිරීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
සමෘද්ධිලාභීන්ට වඩා පහළ ආදායමක් ඇති අඩු ආදායම්ලාභීන් සිටින බැවින්, සමෘද්ධිලාභීන් අඩුආදායම්ලාභී බවට පිළිගන්නා නිර්ණායකය සැලකිල්ලට නොගෙන ග්‍රාම නිලධාරි විසින් අඩු ආදායම්ලාභීන් බවට සහතික කරන ඉල්ලුම්කරුවන් සඳහා රු. 10000/- ක මුදලකට නව ජල සබඳතා ලබා දීම සුදුසුයි.

ඒ අනුව, නව ජල සබඳතා ලබා දීම සඳහා දැනට අය කරනු ලබන රු 7500/- ක ගාස්තුව ප්‍රමානවත් නොවන බැවින්, එම ගාස්තුව රු. 13000/- ක් ලෙස සංශෝධනය කිරීමත්, බෙදා හැරීමේ නල පද්ධතියේ සිට ජල මීටරය දක්වා අවශ්‍ය නල ප්‍රමාණය සහ නැවතුම් කපාට (stop volve) ජල ඉල්ලුම්කරුවන් විසින් සැපයිය යුතු බවත්, යම් ඉල්ලුම්කරුවෙකු නිදන්ගත රෝගාබාධයකින් පෙළෙන බවටත්, එම ඉල්ලුම්කරු අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරි නිර්දේශය සහිතව ඉදිරිපත් කරන ලද අවස්ථාවකදී ඒ පිළිබඳව සලකා බලා මහ සභාවේ අභිමතය පරිදි එවැනි ඉල්ලුම්කරුවන් සඳහා රු. 10000/- ක මුදලක් අය කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(xi).** ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දීමේ වැඩසටහන සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් ඉදිරිපත් කරන ලද ලිපිය ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
මෙහිදී රටේ පවතින උද්ධමන තත්ත්වය පිළිබඳව අවධානය යොමු කර ආර්ථික අපහසුතාවයන්ට ලක්ව ඇති පවුල් සඳහා 2023 නව පාසල් වාරය වෙනුවෙන් අවශ්‍ය වන පාසල් පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය සභා අරමුදල් මඟින් වැය දරා ලබා දීම සඳහා පහත උපදෙස් පිළිපදිමින් වැඩසටහනක් සකස් කරන ලෙස දන්වා ඇත. ඒ අනුව, සභා අරමුදලේ මූල්‍ය හැකියාව හා සභාවට ඉටු කිරිමට පවතින කාර්ය කර්තව්‍ය අධ්‍යයනය කර වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සලසා ගැනීම, බල ප්‍රදේශයේ පාසල්වල අඩු ආදායම්ලාභී හා එළඹෙන පාසල් වාරයේ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පොත් කට්ටලයක් / ඉගෙනුම් ද්‍රව්‍ය මිලදී ගැනීමට අපහසු පාසල් දරුවන්, විදුහල්පතිවරුන්ගේද නිර්දේශ අනුව ඔවුන් තෝරා ගැනීම, ග්‍රාමීය / දුෂ්කර පාසල් සඳහා වැඩසටහන තුළ ප්‍රමුඛත්වය ලබා දීම හා බල ප්‍රදේශය ආවරණය වන පරිදි වැඩසටහනින් සුදුසුම ප්‍රතිලාභීන් තෝරා ගැනිම.
වැය දැරීම සඳහා විධිමත් සභා අනුමැතියක් සහිතව ආකෘති අංක 01 සම්පූර්ණ කර, අදාළ අවශ්‍යතා සම්පූර්ණ වන පරිදි විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කර ප්‍රාදේශීය සභාවක් වන විට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා

පනතේ 132 (ඒ) යටතේ ඒ සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම, 2023 අධ්‍යයන වර්ෂය ආරම්භවීමට පූර්වයෙන් මෙම වැඩසටහන අවසන් කර එමගින් හිමිවිය යුතු ප්‍රතිලාභ ළදරුවන් වෙත ලබාදීමට හැකිවන පරිදි වැඩසටහන සංවිධානය කිරීම, පාසල් පොත් හා අත්‍යාවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා මිලදී ගැනීමට කටයුතු කිරීම, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් මඟින් පළාතේ පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බවත්, පළාතේ ආර්ථික වශයෙන් පීඩාවට පත්ව ඇති සහයෝගය ලබා දිය යුතුම දරු දැරියන්ගේ පොත් හා අත්‍යාවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය සපයා දීමට මෙම වැඩසටහන සංවිධානය කරන ලෙසත් දන්වා එවා තිබෙනවා. එමෙන්ම සංවර්ධන යෝජනා සඳහා මුදල් වෙන් කර ඇතත් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේ කටයුතු නැවත දැනුම් දෙන තුරු ක්‍රියාත්මක කලනොහැකි බැවින් ඒ සඳහා වෙනකර ඇති ලක්ෂ හතළිහක මුදලින් ලක්ෂ විස්සක මුදලක් ආපසු ලබාගෙන මෙය ක්‍රියාත්මක කිරීමට නියමිත බවත්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින්, විදුහල්පතිවරුන් මඟින්, දැනුවත් කිරීමටත් ග්‍රාමනිලධාරි හා විදුහල්පති නිර්දේශය අනුව ළමුන් 500 කට ආධාර ලබා දීමට නියමිත බැවින් කොට්ඨාසය තුල අඩු ආදායම්ලාභීන් දැනුවත් කරන්න.

සභා අරමුදලින් ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී, මුනියන්ඩි මල්ලිකා දේවි මැතිතුමිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දක්වමින්,
ආර්ථික අපහසුතා සහිත පවුල්වල දරුවන්ට පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය ලබා දීමේ දී වසම් මට්ටමින් ලබා දීම සුදුසුයි. ආපදා හානි සිදු වූ පාසල් දරුවන් කෙරෙහි වැඩි අවධානය යොමු කරමු.

ආපදා තත්ත්වය නිසා හානියට පත් වූ මුද්‍රිත පොත්පත් සඳහාත් ආධාර සපයනවාදැයි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඊ.එච්.එම්. ගුනසේන මැතිතුමා විමසා සිටි අවස්ථාවේ දී, මුද්‍රිත පොත් රජය විසින් ලබා දෙන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඒ.පී. එමරෙන්සියා මේරි මැතිතුමිය අදහස් දක්වමින්,
සංවර්ධන යෝජනා සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දීමට නියමිතව තිබුණත් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොවීම නිසා කොට්ඨාස සඳහා වෙන් කරන ලද මුදලේ ප්‍රමාණයට පොත් කට්ටිල ලබා දෙන ලෙසත්, කොට්ඨාසභාර මන්ත්‍රීවරුන් ඒවා බෙදා හැරීමේ අවස්ථාවට සහභාගී කරවා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, එම්. සුරංග මැණික් විජේතුංග මැතිතුමා අදහස් දක්වමින්,
සංවර්ධන යෝජනා සඳහා මන්ත්‍රීවරුන් සඳහා වෙන් කරන ලද රුපියල් ලක්ෂයක මුදල් ලබා නොදීම නිසා කොට්ඨාසභාර මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් නොවන ආකාරයට එම පොත් කට්ටල වසම් මට්ටමින් බෙදා හැරීමටත්, මෙම යෝජනාව ස්ථිර කරන ලද මන්ත්‍රීවරියන් දෙදෙනා නියෝජනය කරන ලද කොට්ඨාස සඳහා විශේෂ අවධානයක් යොමු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී,එච්.ජී. සඳුනි කවීෂා ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින්,
මෙම පොත් කට්ටල ලබා දීමේ දී කොට්ඨාස මට්ටමින් හෝ ග්‍රාම නිලධාරි මට්ටමින් ලබා දීමට කටයුතු කරමු. ආපදා හානි වැඩි වශයෙන් බලපා ඇති අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛත්වය ලබා දීම සුදුසුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, පී.කේ. සමන්ත කුමාර කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින්,
නළවෙල වසමට සුළං තත්ත්වය නිසා දැඩි ලෙස අලාභ හානි සිදු වී නොමැති බැවින්, ආපදා තත්ත්වයට පෙර සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා මෙම තීරණය ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇතත් ආපදාහානි වූ පාසල් දරුවන්ට මෙම සහන සලසා දීම කදිම අවස්ථාවක් බැවින්, ප්‍රාදේශීය ලේකම්තුමිය මඟින් ආපදා හානි වැඩි වශයෙන් බලපා ඇති අඩු ආදායම්ලාභීන්ගේ තොරතුරු ලබාගෙන ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දී මෙම ආධාරය ලබා දීමට කටයුතු කරමු.

අඩු ආදායම්ලාබී පාසල් දරුවන් සඳහා පොත් කට්ටල 1000 ක් ලබා දීම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා යෝජනා කිරීමත් සමඟම, සභා අරමුදල් තත්ත්වය සැලකිල්ලට ගෙන මෙම ආධාර ලබා දීමට කටයුතු කරන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා විසින් දන්වා එවා ඇති බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී. එම ප්‍රකාශයත් සමඟ කොට්ඨාස මට්ටමින් පොත් කට්ටල 750 ක් බෙදා දීම සුදුසු බවට ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා නැවතත් යෝජනා කරන ලදී. එම අවස්ථාවේ දී පළමු වරට පොත් කට්ටල 500 ක් බෙදා දීමත්, ආධාර ලැබිය යුතු අඩුආදායම්ලාබී දරුවන් පිළිබඳව නැවත අවධානය යොමු කර තවත් පොත් කට්ටල 250 ක් ලබා දීමට පියවර ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් යෝජනා කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ටී.ආර්. දිනසිරි පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින්,
අඩු ආදායම්ලාබී දරුවන් නිසි පරිදි හඳුනා නොගෙන ආධාර බෙදා හැරීමක් සිදුවුවහොත් අනවශ්‍ය ප්‍රශ්න මතු වීමට අවස්ථාව ඇති බැවින් ග්‍රාම නිලධාරිගේ හා විදුහල්පතිතුමාගේ නිර්දේශය පරිදි අදාල නිර්ණායක සැලකිල්ලට ගෙන ආධාර බෙදාහැරීමට කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා අදහස් දක්වමින්,
වසම් මට්ටමින් පොත් කට්ටල බෙදා හැරීමේ දී මා නියෝජනය කරනු ලබන කොට්ඨාසයට අසාධාරණයක් සිදු වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, ඩබ්. නිරංජලා විජේසිංහ මැතිතුමිය අදහස් දක්වමින්,
වසම් භාරව කටයුතු කරනු ලබන සංවර්ධන නිලධාරීන් විසින් අඩු ආදායම්ලාබීන්ගේ තොරතුරු ලබාගැනීමට කටයුතු කළා. එම නිසා මෙම වැඩසටහන එම තොරතුරු මත පදනම්ව සාර්ථක අන්දමින් ක්‍රියාත්මක කරවා ගැනීමට හැකියාව පවතිනවා.

අනතුරුව, ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
යම් ආකාරයකට සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින වසම් සහ බල ප්‍රදේශය තුල පවතින බැවින්, පොත් කට්ටල බෙදා හැරීමේ දී අඩු ආදායම්ලාබී දරුවන් නිසි අයුරින් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම මෙය දේශපාලනීකරණයෙන් තොරව, ග්‍රාමීය දුෂ්කර පාසල් සඳහා ප්‍රමුඛත්වය ලබා දී අඩු ආදායම්ලාබී දරුවන් සඳහා පමණක් මහජන නියෝජිතවරු විසිපස් දෙනාම නියෝජනය වන පරිදි, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ පරිත්‍යාගයක් ලෙස නම් කරමින්, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවෙන් සිදු කරනු ලබන ප්‍රජා සත්කාරක වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමු. සභාපති ධුර කාලයේ දී මා නියෝජනය කරනු ලබන කොට්ඨාසයට ලබාදිය යුතු උපරිම සේවය ලබා දීමට කටයුතු කළ බැවින්, පාසල් දරුවන්ට පොත් ලබා දීමෙන් දේශපාලන ක්‍රියාවලියේ නිරත වීමට මා බලාපොරොත්තු නොවන අතර ආධාර ලබා දිය යුතුම අයට ප්‍රමුඛතාවය ලබාදීම මගේ අරමුණයි. එම නිසා අලුත්නුවර කොට්ඨාසය සඳහා පොත් බෙදා හැරීමේදී අවශ්‍ය ඕනෑම කෙනෙක් ඒ සඳහා සහභාගී වී පොත් බෙදා දීමට කටයුතු කරන්න. රට තුල පවතින ආර්ථික උද්ධමන අවස්ථාවේ දී සංවර්ධනා යෝජනා ක්‍රියාත්මක කළ නොහැකි බැවින්, ඒ සඳහා වෙන් කරන ලද මුදලින් අඩු ආදායම්ලාබී දරුවන් සඳහා සභා අරමුදල් තත්ත්වය සලකා බලා රු. 3000 ක වටිනාකමකින් යුතු පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය කට්ටල 500 යක් අඩු ආදායම්ලාබී දරුවන් බවට ග්‍රාම නිලධාරි හා විදුහල්පති නිර්දේශය මත ලබා දීමටත්, මෙම පොත් කට්ටල 500 ප්‍රමාණවත් නොවන විටක දී සභාවේ මූල්‍ය තත්ත්වය සලකා බලා අමතර පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය කට්ටල 250 ක් ලබා දීමට කටයුතු කරමු.

ඒ අනුව, සභා අරමුදල් තත්ත්වය සලකා බලා රු. 3000 ක වටිනාකමකින් යුතු පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය කට්ටල 500 යක් අඩු ආදායම්ලාබී දරුවන් බවට ග්‍රාම නිලධාරි හා විදුහල්පති නිර්දේශය මත ලබා දීමටත්, මෙම පොත් කට්ටල 500 ප්‍රමාණවත් නොවන විටක දී සභාවේ මූල්‍ය තත්ත්වය සලකා බලා අමතර පොත් හා ඉගෙනුම් ද්‍රව්‍ය කට්ටල 250 ක් ලබා දීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(xii).** සභාවට අයත් පින්නවල මහජන පොළ **2022/12/08** වන දින පැවැති අධික සුළං තත්ත්වය හේතුවෙන් අලාභහානි වී ඇති බවත්, මෙමඟින් පින්නවල මහජන පොළේ කඩකාමර හා වෙළඳකුටි කිහිපයක වහලය කඩා වැටී ඇති බවත්, එම අලාභහානි ඇස්තමේනතු කර ඒවා නැවත පිළිසකර කිරීමට සිදුවී ඇති බැවින්, වෙළඳකුටි අලුත් වැඩියා කර යථා තත්ත්වයට පත් කිරිම සඳහා සකස් කරන ලද ලිපිය හා ඊට අදාල දළ ඇස්තමේන්තුව ගරු සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමා ඒ සම්බන්ධයෙන් නැවතත් අදහස් දක්වමින්,
කාර්මික නිලධාරි මහතා විසින් එම අලුත්වැඩියා කටයුතු සඳහා රු. **268800.00** ක දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙනවා. ආපදා තත්ත්වය වෙනුවෙන් අලාභහානි සඳහා ගෙවීම් කරනු ලබන්නේනම් ඒ පිළිබඳව දැනුම් දී හානි පූර්ණ ලබා ගැනීමටත් එසේ නොවන්නේනම් සභා සභා අරමුදලින් පොළ භූමිය හා වෙළඳකුටි අලුත්වැඩියා කල යුතුයි.
ආපදා හානියට ලක් වූ පින්නවල පොළ භූමිය හා වෙළඳකුටි අලුත්වැඩියා කිරිම සඳහා ඉදිරිපත් කරන ලද රු. **268800.00** දළ ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවත්, ආපදා හානි ලබා ගැනීම සඳහා අදාල අංශ දැනුවත් කිරිමට පියවර ගැනීම සුදුසු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ආර්.ඒ සමන්ත ජයසිංහ මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජී.ඩී.එන්.එන්. අබේවික්‍රම මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව, ආපදා හානියට ලක් වූ පින්නවල පොළ භූමිය හා වෙළඳකුටි අලුත්වැඩියා කිරිම සඳහා ඉදිරිපත් කරන ලද රු. **268800.00** දළ ඇස්තමේන්තුව අනුමත කිරිමේ, ආපදා හානි ලබා ගැනීම සඳහා පළාත් සභා ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය හා අදාල අංශ දැනුවත් කිරිමට පියවර ගැනීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොමැති බැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

## (06). කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.

## (06). (i). ගෙවීම අනුමත කිරීම.

මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද නොවැම්බර් මස **01** වන දින සිට නොවැම්බර් මස **30** වන දින දක්වා ගෙවීම් කරන ලද අනු අංක **1 - 84** සහ වවුචර් අංක **940** සිට **1032** දක්වා ගෙවීම් විස්තර වාර්තා සහ වවුචර් උපලේඛන **2022.12.02.** වන දින පැවැති මුදල් කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, මුදල් කමිටුවේ අනුමැතිය ලත් එම වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව මහ සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමින් එම යෝජනාව සභා සම්මත කර ගන්නා ලෙසට ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් මුදල් කමිටුවේ නිර්දේශ ලද වවුචර් වාර්තා සහ මුදල් කමිටු වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරන ලදී.
ගරු උප සභාපති, එච්.එම්. වසන්ත බන්දුසේන මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව මුදල් කමිටුවේ අනුමැතිය ලත් වවුචර් උපලේඛන හා මුදල් කමිටු වාර්තාව අනුමත කිරීමේ එම යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව සභා සම්මත විය.

## (06). (ii). ටෙන්ඩර් මණ්ඩල වාර්තාව ඉදිරිපත් කිරීම.

**2022.11.21.** දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,
**01.** ප්‍රධාන කාර්යාලය සඳහා ලැප්ටොප් වර්ගයේ පරිගණකයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

**2022.12.02.** දින පැවැති ප්‍රසම්පාදන කමිටුව විසින්,
**01.** කැපොක්වත්ත කසල අංගනය සඳහා අවශ්‍ය මැෂී නාශක මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.
**02.** ප්‍රධාන කාර්යාලය හා සෞඛ්‍ය අංශ සේවකයින් සඳහා එදිනෙදා පාවිච්චි කරන ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
**03.** ප්‍රාදේශීය සභා පානීය ජල ව්‍යාපෘති සඳහා ජල මීටර් මිලදී ගැනීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.

**04.** බල ප්‍රදේශයේ වීජී පහන් නඩත්තු කිරීම හා සවිකිරීම සඳහා අවශ්‍ය වීජී පහන් උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.
**05.** ප්‍රධාන කාර්යාලයේ ඉන්ධන ගබඩා කිරීමේ ස්ථානයක් සැකසීම වෙනුවෙන් මිළ ගණන් කැඳවීම.
**06.** ප්‍රධාන කාර්යාලයේ භෝජනාගාරයේ මේස සැකසීම වෙනුවෙන් මිල ගණන් කැඳවීම.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැඳවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමට අදාල වූ ප්‍රසම්පාදන කමිටු වාර්තා සහා අනුමැතිය සඳහා ගරු සභාපතිතුමා විසින් සභාගත කරමින් එම වාර්තා සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරන ලදී.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැදවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බී.එම්. අජිත් බණ්ඩාර මැතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ මිල ගණන් කැදවන ලද ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීමට හා සේවාවන් ලබා ගැනීමේ එම යෝජනාවලට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## (07). ආදායම් වියදම් වාර්තාව.

**2022** නොවැම්බර් මස ආදායම් වියදම් වාර්තාව මහ සභාවේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

## (08). වෙනත් කරුණු.

**(i).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමා අදහස් දක්වමින්,
ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නෙල්ලිවල මාර්ගයේ ධාවනය වූ ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය බලංගොඩ ඩිපෝවට අයත් සිසුසැරිය පාසල් බස් රථය මාසයක පමණ කාලයක සිට ධාවනය නොවීමෙන් මුදල් ගෙවා ගමන් වාර ප්‍රවේශ පත්‍ර ලබා ගෙන ඇති පාසල් දරුවන්, රජයේ රැකියා සඳහා ගමන් කරන්නන් හා ප්‍රදේශවාසී ජනතාව දැඩි අපහසුතාවයට පත්ව සිටී. මේ අවස්ථාව වන විට එම බස් රථය වෙනත් මාර්ගයක ධාවනයේ යොදවා ඇතත්, නෙල්ලිවල මාර්ගයේ වෙනත් බස් රථයක් ධාවනය නොවන බැවින්, මෙම මාර්ගයේ ගමන් ගන්නා පාසල් දරුවන්ගේ, රැකියාවල නියුතු අයගේ දෛනික කටයුතුවල පහසුව සඳහා බස් රථයක් ධාවනයේ යොදවන ලෙසට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය බලංගොඩ ඩිපෝ කළමනාකරු වෙත දන්වා යැවීමට කටයුතු කරමු.

**(ii).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමා අනතුරකට ලක් ව ප්‍රතිකාර ලබමින් සිටින බැවින් අද දින මාසික මහ සභාවට නොපැමිණෙන බව දූරකතනය මඟින් දැනුම් දුන්නා. එබැවින් එතුමන්ගේ නිවාඩු අනුමත කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.ඒ. සුමිත් ගුනරත්න මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඉන්දික රෝහන ජයමාන්න මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාවට වෙනත් විරෝධතා නොවූයෙන් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(iii).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දක්වමින්,
ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය බලංගොඩ ඩිපෝවට අයත් සිසුසැරිය පාසල් බස් රථය නෙල්ලිවල මාර්ගයේ ධාවනය නොවීම හේතුවෙන් වාර ප්‍රවේශ පත්‍ර ලබාගත් පාසල් දරුවන් දැඩි අපහසුතාවයට පත්ව ඇති අතර රටතුල උද්ගතව ඇති උද්ධමන තත්ත්වය නිසා දිනපතා අතේ ඇති මුදල් දරුවන්ට පෞද්ගලික බස් රථ මඟින් පාසල වෙත යාමට ලබා දීම නිසා දෙමාපියන් ද දැඩි අපහසුතාවයට පත්ව ඇත. වසර ගණනාවක් නෙල්ලිවල මාර්ගයේ ධාවනය වූ බස් රථය පාසල ආරම්භ වන වෙලාවට සහ අවසන් වන වේලාවට හෝ ධාවනයේ යොදවන ලෙසට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බලංගොඩ ඩිපෝ කළමනාකරු වෙත දන්වා යවමු.

**(iv).** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමාගේ අදහස් දක්වමින්,
අධික සුළං තත්ත්වය හේතුවෙන් ගොවිබිම් වලට හානිවීම හේතුවෙන් එම ගොවිබිම් නැවත යථා තත්ත්වයට පත් කරවා ගැනීම සඳහා සහන මිලට පොහොර ලබා දෙන ලෙසට ප්‍රාදේශීය ගොවිජන සේවා සංවර්ධන නිලධාරි මහතා වෙත දන්වා යවමු.

ගරු උපසභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා සහ අදහස් සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා පිළිතුරු සහ විසඳුම් ලබා දීමට අදහස් දක්වමින්,

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ජේ. ආර් ජයානන්ද මැතිතුමාගේ සහ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී, එම්.එම්. චාන්දනී කුමාරි ජයතිලක මැතිතුමිය අදහස් දැක්වීම අනුව,
නෙල්ලිවල මාර්ගයේ ධාවනය වෙමින් පැවැති සිසුසැරිය බස් රථය නැවත ධාවනයේ යෙදවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසට බලංගොඩ ඩිපෝ කළමනාකරු දැනුවත් කිරීමටත්, එහි පිටපතක් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමටත් පියවර ගන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩබ්.අයි. චමින්ද ප්‍රසාද් මැතිතුමා අදහස් දැක්වීම අනුව,

අධික සුළං තත්ත්වය නිසා වගාහානි වූ ගොවිබිම් යථා තත්ත්වයට පත්කරවා ගැනීම සඳහා සහන මිලට පොහොර ලබා දෙන ලෙසට රත්මලවින්න ප්‍රාදේශීය ගොවිජන සේවා සංවර්ධන නිලධාරි වෙත දන්වා යැවීමට කටයුතු කරනවා.

සභාපති ධූර කාලයේ දී දේශපාලන කටයුතු මෙහෙයවීමේ දී මා නියෝජනය කල කොට්ඨාසයට අවශ්‍ය මෙහෙවර ඉටු කිරීමට මා හැකි උපරිමයෙන් කටයුතු කළා. ඔබතුමන්ලාත් ඔබතුමියන්ලාත් නියෝජනය කල කොට්ඨාසය සඳහා හැකි උපරිමයෙන් සේවය කරන්න ඇතැයි මා සිතනවා. මා මෙන්ම හිටපු සභාපති, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී, ඩී. ආර්. ඉන්ද්‍ර ගුණතිලක මැතිතුමා එතුමා නියෝජනය කල කොට්ඨාසයට උපරිමයෙන් සේවය කළත් එතුමා පැරදුණා. ඒ අනුව දේශපාලන ක්‍රියාවලියේ දී සේවය කිරීමම මැතිවරණ ජය පරාජයට හේතුවක් නොවිය හැකියි. එය මහජන නියෝජිතවරුන්ගේ වගකීමක් පමණි. පළාත් පාලන ආයතන විසුරුවා හැරීමේ ක්‍රියාවලිය ඕනෑම වේලාවක සිදු විය හැකි බැවින්, එතෙක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ලෙස මමත්, ඔබතුමන්ලා හා ඔබතුමියන්ලා සැම දෙනාත් මහජන නියෝජිතවරුන් ලෙස නියෝජනය වෙනවා. මා මෙන්ම මෙරට බහුතර ජනතාවක් පිළි ගන්නා මතය වන්නේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මෙරට දේශපාලන සංකේතය බවයි. එහෙත් **2015** ජනාධිපතිවරණ මැතිවරණයේ දී එතුමා පැරදුණා. එතුමා පැරදුණු රටක අනෙකුත් අයගේ දේශපාලන ක්‍රියාවලිය පිළිබඳව කතා කළ යුතු නෑ. ධූර කාලය පවතින තෙක් වැඩ කරමු. අද රාත්‍රියේ පළාත් පාලන ආයතන විසුරුවා හැරියත් මගේ හිතට එකඟව පගාව ලබා නොගත් සභාපතිවරයෙක් ලෙස සභාවෙන් නික්ම යාමට හැකියාව තිබෙනවා. මා කෙදිනකවත් සභාවේ දේපල සොරකම් කලේ නැහැ. කවුරුන් කුමන දෙයක්, කෙසේ ප්‍රකාශ කළත් එය මට ප්‍රශ්නයක් නොවේ. හේතුව එය මගේ හෘද සාක්ෂියයි. තමුන්නාන්සෙලාගේ ක්‍රියාවන් ගැන ඔබතුමන්ලාගේ හෘද සාක්ෂියට ඔබතුමන්ලාට එකඟ විය හැකියි. කිසිවෙක් විසින් සභාව හෝ ආණ්ඩුව විවේචනය කළත්, සභාව නියෝජනය කර අදහස් ප්‍රකාශ නොකර මන්ත්‍රී දීමනාව ලබාගෙන නික්ම ගියත් ඔවුන්ගේ වගකීම එය වුවත්, සභාපතිවරයා ලෙස මට කා සමඟවත් පෞද්ගලික අමනාපකම් නැහැ. වසර **05** ක කාලයක් තුල සභාවේ සියළු කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී සහය ලබා දුන් ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ට ස්තූතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නවා. මහජනයාට සේවය කිරීමේ දී මාගේ ක්‍රියා කලාපයන් නිසා යම් අයෙකුගේ සිතරිදුණු යමක් සිදුවුණානම් ඒ සම්බන්ධයෙන් කණගාටුව පල කරනවා. වසංගත අවස්ථාවේ, ආර්ථික අස්ථාවර අවස්ථාවේ, යම් යම් දුෂ්කර කාලවකවානුවලදී සභාවේ කටයුතු පිළිබඳව ලංකාව තුලත් මුළු ලෝකය පුරා ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ නාමය ඔසවා තබන්නට තරම් දායකත්වයක් ලබාදුන් මාධ්‍ය වේදී මහතුන් සැමටත් ස්තූතිය පල කිරීමට මෙය අවස්ථාවක් කරගන්නවා. **2023** වර්ෂය ඉඹුල්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවටත්, ඔබ සැමටත් සුභම සුභ අනාගතයක් මෙන්ම සහ සුභ නව වසරකට සුභ පැතුම් එක් කරමි.

**(09). මී ළඟ සභා වාරයට දින නියම කිරීම.**
**ඊළඟ සභා වාරය 2023 වර්ෂයේ ජනවාරි 10 වෙනි අඟහරුවාදා දින පැවැත්වීමට කටයුතු කරනවා.**

**(10). ස්තුති කතාව හා අවසානය.**
**හත්වන සභාවේ පනස් අටවන සභාව සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ නිලධාරින් සියළු දෙනාටත්, මාධ්‍යවේදී මහතුන් සියළු දෙනාටත්, මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමි.**

**ඉන් අනතුරුව, පෙ.ව. 11.35 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් විය.**

**එස්. ජී.වී.ඒ. ශ්‍රී ලාල් සෙනරත්,**
**සභාපති,**
**ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව.**